# රත්නපුර ප්‍රාදේශීය සභාව 2023.02.08 වන දින මහා සභා රැස්වීම

රත්නපුර ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2023.01.12 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාවේ දී පැවැත්විණි.

මෙදින රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනය:-

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ඩබ්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| 02. | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | ගරු උප සභාපති |
| 03 | එන්.විජය ශ්‍රී ශාන්ත කුමාර මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 04. | ටී.ප්‍රේමතිලක මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 05. | රණවක කළුආරච්චි මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 06. | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 07. | ටී.ජී.ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 08. | අයි.ඩබ්ලිව් අකිල රෝෂන් ලක්මාල් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 09. | බී.ප්‍රියන්ත මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 10. | පී.වී.අයි.එල්.විතාරම මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 11. | යූ.කේ නන්දාවතී මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 12. | ඒ.එම්.නිලන්ති අමරකෝන් මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 13. | කේ.ජී.එන්.අමරසිංහ මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 14 | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 15 | ගෝපාල් තම්බිරාජා මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 16. | කේ.ඒ.ජයරත්න මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 17. | වජිරා නන්දනී මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 18. | උදය කුමාර් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 19. | ඒ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 20. | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 21. | ලීලානි චන්ද්‍රතිලක මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 22. | එල්.එම්.තමරා සුභාෂිණී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 23. | ආර්.බී.නාලක සුදත්සිරි හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 24. | ඊ.කේ.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 25. | මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 26. | අනූෂ විරාජ් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 27. | ලලිත් බෝතුංගආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 28. | ආර්.ඒ.පද්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

| | | |
|---|---|---|
| 01. | ඕ.කේ. සුගත් ජයවික්‍රම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 02. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 03. | රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | මංජුල ශ්‍රී ලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | ඩී.නිලන්ති දීපිකා යසරත්න මෙනවිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | නිශාන් දමිත් අල්ගම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 07. | පී.වී.ඉසුරු ජයලත් විතාරම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 08. | එම්.ඒ.ඩික්සන් ජයතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා**

**සහභාගීවූනිලධාරීන් :-**

01.එම්.ඒ.කේ.ටී.අමරසිංහ මහත්මිය - ලේකම්

02.ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මිය - සංවර්ධන නිලධාරී

01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

2023.01.12 වන දින මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**03.ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම.**

i. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යංශය මාධ්‍ය ලේකම් ගේ අංක HIG/Min/Off/04/iii හා 2022.11.25 දිනැති "රත්තුරුගල සිට රත්නපුර දක්වා සිසු සැරිය බස් රථයක් ලබා ගැනීම සම්බන්ධවයි" මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

I. රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඉතා පුළුල් ප්‍රදේශයක් බැවින් ඉදිරියේදී සවි කිරීමට නියමිත වීථි ලාම්පු සවි කිරීම සඳහා දෛනික වැටුප් මත සේවය කිරීම සඳහා විදුලි කාර්මික කටයුතු සඳහා සුදුසු පුද්ගලයන් දෙදෙනෙකු හා ඊට අදාල සේවා සැපයීම සඳහා ප්‍රවාහන කටයුතු වෙනුවෙන් වාහනයක් යෙදවීම වෙනුවෙන් කිරීමටත් සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී අනුෂ විරාජ් මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

II. **ගරු සභාපතිතුමාගේ දියණිය වන සෙනුරි සමාධි දරුවාගේ අසනීප තත්වය හේතුවෙන් සිදුකරන ලද ශල්‍ය කර්මය සඳහා විශාල මුදලක් වැයවී ඇති අතර, 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 132 ඒ හා ඔ වගන්ති වලට අනුව ඒ සඳහා වැයවූ මුදල් සභා අරමුදලින් ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට යොමු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

III. ආර්ථික අපහසුතා සහිත පවුල්වල දරුවන්ට පාසැල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ වැඩසටහන සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

IV. එගොඩ මල්වල, මල් වල පදිංචි ආර්. ඒ. චන්ද්‍රිකා රණසිංහ මහත්මියගේ නිවසට සෙවිළි තහඩු අඩි 12 ප්‍රමාණයෙන් 8ක් ලබාදීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනිමට යොමු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**05:01 හදිසි යෝජනා**

**I.** **2023.01.12 දිනැති** මහා සභා රැස්වීමේ යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 05 යටතේ ix වන සභා තීරණයේ සඳහන් කාරණය ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන තෙක් හිඟ ආදායම් අයකර ගැනීමට සිදුවන ප්‍රමාදය වළක්වා ගැනීම පිණිස මෙම තීරණයේ සඳහන් පරිදි ආදායම් එකතු කිරීම සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත සේවකයන් දෙදෙනා වෙත මසකට රු:-7500.00ක දීමනාවක් ලබාදීම සඳහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු උප සභාපති ජී.ජී.ජානක පුෂ්පකුමාර මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**II.** පහත සඳහන් අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් ඔවුන්ගේ නිවෙස්වල වහළය සකස් කර ගැනීම සඳහා සෙවිලි තහඩු ලබා දීමට ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

- **පහළ නුගේපොළ , ගල්ලැල්ල ලිපිනයැති දිමුතු සඳරුවන් මහතා ගේ නිවස හදිසි ආපදාවට ලක්වීම හේතුවෙනි. අඩි 10 සෙවිලි තහඩු 20ක් ලබා දීම.**

- **පහළගම, වේවැල්වත්ත,රත්නපුර ලිපිනයැති පී.වී. පත්මසිරි විතාරම මහතාගේ නිවස සඳහා අඩි 12 සෙවිලි තහඩු 15ක් ලබා දීම.**

- **දිවියාගල සිරියලතා මහත්මියගේ නිවස සකස් කර ගැනීම සඳහා අඩි 10 ඇස්බැස්ටස් ගහඩු 10ක් ලබාදීම.**

III.2022.12.31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් අමරසිංහ මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**06.කාරක සභාවල වාර්තා**

2023.01.30 වන දින මුදල් කාරක සභා වාර්තාව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු උප සභාපති ජී .ජී.ජානක පුෂ්ප කුමාර මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

මාසික ආදායම්, වියදම් සාරාංශ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

**08.ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා**

i. **ගරු මන්ත්‍රී නිලන්ති අමරකොන් මහත්මිය**

ඕලුගල මාර්ගය රුදවුම් ගන්න තිබුණා එහි රුදවුම් නිදහස් කරලා තිබුණා නමුත් ගන්න යද්දි රිටන් කරලා තිබුණා එහෙම වුනේ ඇයි කියලා සභාපතිතුමාගෙන් දැනගන්න කැමති බව ගරු මන්ත්‍රී තුමිය පැවසුවේය.

මගේ මල්වල කොට්ඨාශයේ ඔළුගල පාර පළාත් සභාවේ මාර්ග ලේකම් තුමා හමුවෙලා ව්‍යාපෘතියක් ගත්තා ඒක ලක්ෂ දහ හතරක ව්‍යාපෘතියක් ඒක කළේ සභාපතිතුමාගේ වුවමනාවට ඩයස් කියලා කෙනෙක් එකේ අක්‍රමිකතා සිදු වෙන කොට මං ඒ පිළිබඳව තුන් වතාවක් මේ සභාවෙත් කතා කරලා තියෙනවා. මන්ත්‍රීවරුන්ට ඇහෙන් නැතුව වෙන්න ඇති සභා ව්‍යාපෘතියක් සේ සිදුකර විනාශ කළ මේ පාර සකස් කර දෙන්න කියලා මං කිහිප විටකදීම ඉල්ලීම් කළ බව එතුමිය පැවසුවේය. පාර ප්‍රමිතියට හදලා නැතුව පාර කැඩිලා ගියා . ඊට පස්සේ ගමේ මිනිස්සු එකතුවෙලා ලක්ෂ හතරක් පමණ වියදම් කරලා පිළිසකර කිරීම් කළා. මිනිස්සු දන්නවා මං වරදක් කරන්නේ නැහැ කියලා නැත්නම් මේ පාර කැඩීයාම මට ප්‍රශ්ණයක් වෙනවා.ඊට **පස්සේ පාර හැදුවට පස්සේ රුදවුම් නිදහස් කරන්න චෙක් එකක් ලියලා තියෙනවා නමුත් පාර හැදුවේ සභාවෙන් නෙවෙයි. චෙක් එකක් ලියලා පොතටත් දාල තියෙනවා නමුත් ගන්න යන අවස්ථාවේ චෙක්පත නැහැ. මුදල් අතට ගන්න හිතන්න ඇති නමුත් මිනිස්සු කිව්වා එය ගන්න ඉඩ දෙන් නැහැ කියලා මොකද මිනිස්සු ඒ පාර හදපු නිසා .චෙක් එක රිටන්වෙලා තියෙනවා.කමක් නැහැ එය එහෙම වුනාට මට ඕනි මෙම ඇත්ත කතාව සභාගත වෙන්න විතරයි.**

මගේ කොට්ඨාශය තුළ යම් දෙයක් සිදු කරද්දී මගේ අතින් වියදම් දරලා කළ අවස්ථා එමටයි. ඒවා ගරු සභාපතිතුමාට නමක් හදලා දෙන්න කටයුතු කළ අවස්ථා වල වුවද කැපවීමෙන් කටයුතු කළත් ඇතැම් උත්සව අවස්ථාවල දී ව්‍යාපෘති විවෘත කිරීම් වැනි අවස්ථාවලදී මගේ නමවත් සඳහන් කරන්නේ නැහැ. එසේ කිරීම පිළිබඳව අප්පිරියාවක් ඇති බව එතුමා පැවසුවේය. කමක් නැහැ නම නොතිබුණාට වැඩේ වෙන්නයි ඕනි.මල්වල පොදු වැසිකිළිය කාරණයේදීත් එයමයි සිදු වුනේ. මිනිස්සු එකතු වෙලා වැඩ අවසන් කළාට පස්සේ රුදවුම් ලැබෙන්නේ නැහැ. මේ කොන්ත්‍රාත් කරපු කෙනාට ලැජ්ජාවක් නැද්ද දන්න නැහැ රුදවුම් ඉල්ලන්න.මේ සඳහා චෙක්පතක් ලබා දුන්නා නම් කාර්මික නිලධාරී ගේ සිට මේ හා සම්බන්ධ වුනු නිලධාරීන් වගකිව යුතුයි. තම තමන්ගේ දිස්නය වෙනුවෙන් පමණක් කටයුතු කරගෙන තමන් වටේ සිටින පිරිස වලට වට්ටන මෙවැනි නායකයින් බිහි නොවේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අපි කරන හොඳ නරක දෙකම පහුවෙලා හරි ප්‍රතිඵල ලැබෙනවා. ඕළුගල පාරේ රුදවුම් මුදල් ගැනීම සම්බන්ධව ජනතාව දැනුවත් විය යුතුයි. ඒ නිසා මේවා සභාගත විය යුතු බව එතුමිය පැවසුවේය.

**ගරු සභාපතිතුමාගේ පිළිතුරු කතාව**

කණගාටුවෙනවා මේ කාරණාව සම්බන්ධව සභාවේ බොරුකීම සම්බන්ධව ඒ ලැජ්ජාවක් නැතිකම වෙන්න ඇති පළාත් සභාවේ යම් යම් අය. මුදල් අනුමත කරගෙන ඇවිත් ව්‍යාපෘතිය මෙහෙන් කරලා පළාත් සභාවෙන් මුදල් ආවම චෙක් ඒක ලියාගන්නවා මේ ව්‍යාපෘතිය අවසන් කරලා දැන් අවුරුදු ඒකහමාරක් වෙනවා. මට කාර්මික දැනුම නැහැ. මට තියෙන්නේ මුදල් ආවාම සමිතියකට හෝ දීලා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කිරීමයි. මෙහි ගිවිසුම් අත්සන් කරලා තියෙන්නේ ඔළුගල දිරියකාන්ත සමිතිය, කාර්මික නිලධාරී නිර්දේශ කරලා තිබෙනවා , පළාත් සභාවේ ඉංජිනේරු අනුමත කරලා තියෙනවා ප්‍රාදේශිය සභාවේ සභාපති ඇරෙන්න කාර්මික නිලධාරීගේ තනතුර කරන්නෙත් නැහැ. පළාත් සභාවේ ඉංජිනෙරුගේ තනතුරත් නොකරන බව ගරු සභාපතිතුමා පැවසුවේය. ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලින් පැමිණුනු ව්‍යාපෘති ගණනනාවක් ප්‍රාදේශිය සභාව හරහා සිදුක කළ බවත්, ඒ සඳහා මුදල් සභාවට ලැබුණු විට ගෙවීම් කළ බවත්, සභාවේ අරමුදල් ගෙවීම් නොකළ බවත් එතුමා පැවසුවේය. මෙම මාර්ගය සඳහා ද පළාත් සභාවෙන් මුදල් ලැබුණු පසු රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කළ බවද, එම මුදල් අදාල සමිතියට ලබා දීම නීතියානු කුළ බව ගරු සභාපතිතුමා පැවසුවේය. එසේම මෙම මාර්ගය පසුගිය වර්ෂා කාලයේදී සේදී ගොස් ඇති බවත්, එය වර්ෂ එකහමාරකට පමණ පසුව සිදුවූවක් බවද එතුමා පැවසුවේය. අනතුරුව ගමේ මිනිසුන් යොදවා පාර පිළිසකර කළත් අදාල මුකල් මෙම ව්‍යාපෘතිය සිදුකළ සමිතියට ගෙවිය යුතු බව එතුමා පැවසුවේය.

**ii. ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා**

ඔළුගල අලුතින් පාරක් සකස් කිරීම සඳහා මේ සභාවෙන් ඉල්ලීමක් කර තිබුණා ඒ ලිඛියේ පිටපතක් මටත් එවා තිබුණා නමුත් අද ඒක ගේන්න නොහැකි වුනා ඒ සම්බන්ධව ඉදිරියට කළ හැකි දේ සම්බන්ධව සොයා බලා කටයුතු කරන්න කියලා මා ඉල්ලීමක් කරන බව එතුමා පැවසුවේය.

සමගි ජන බලවේගයෙන් ප්‍රාදේශිය සභාවට තරඟ කිරීම සඳහා අත්සන් කරන ලද සියළුම මන්ත්‍රීවරුන්ගේ නම් තව සති දෙකක් තුනක් යන විට අයින් කරයි කියලා විශ්වාසයක් තියෙනවා. අපිට දැනටමටත් නිදහසට කරුණු ඉල්ලා ලිපි ලැබී තිබෙනවා. අපිට කියන්න නිදහසට කරුණු නොමැති බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය. කවුරුත් කියන්න අවශ්‍ය නැහැ පත්ෂ ව්‍යවස්ථාවේම තියෙනවා වෙනත් පක්ෂයක නාම යෝජනාවකට අත්සන් තැබුවහොත් පක්ෂ සාමාජිකත්වය අහෝසි වන බව ඒ අවස්තාව අපිට උදාවෙනවා එය සතුටින් පිළිගන්නා බව එතුමා පැවසුවේය. 1997 සිට මේ සභවාට පැමිණි පළමු අවස්ථාවේ සිට අද දක්වාම සිටින කිහිප දෙනෙකුම සිටිනවා ඔවුන් සියළුම දෙනා සමඟ සුහදව වැඩ කිරීමට අවස්ථාව ලැබුණු බවත් , මේ අවස්ථාවේදී සභාවේ රාජකාරී කටයුතු කරන අවස්ථාවලදී සහයෝගය ලබා දුන් ලේකම් තුමිය ඇතුළු නිලධාරීන්ට සේවකයින් සියළුම දෙනාට ස්තුතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා බවද එතුමා පැවසුවේය.

**iii. ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා**

ලලිත් මන්ත්‍රීතුමාලා නිහාල් මන්ත්‍රීතුමා හා අපි පක්ෂ වෙනස් වුනත් සහෝදරයන් වගේ හිටියා. කෙසේ නමුත් පක්ෂවල තිබෙන ප්‍රතිපත්ති සමඟ තීන්දු තීරණ ගන්නට සිදු වුවත් ඔබ තමුන්නාන්සේලා වෙන්ව ගියත් කණගාටුවක් තිබෙනවා. නමුත් ඊළඟ සභාවකදී හරි මුණගැහෙන්නට ප්‍රාර්ථනා කරන බව එතුමා පැවසුවේය.

**iv. ගරු මන්ත්‍රී බී.ප්‍රියන්ත මහතා**

ලලිත් බෝතුංග ආරච්චි මහතා හා අපි අතර පක්ෂ අතර මතවාද තිබුණත් අපි එකමුතු කමින් මනුස්සයො වශයෙන් ඇසුරු කළ බවත්,ඉදිරි මැතිවරණයේදී සියළුම දෙනාට සභාවට නැවත වරක් තේරීපත්වීමට හැකියාව ලැබේවා ප්‍රාර්ථනා කරන බවත් එතුමා පැවසුවේය. අනෙකුත් සියළුම දෙනාටම වඩා ප්‍රශ්න තමන් වෙත පැමිණි බවත්, ඒ සියළුම දේ පිළිබඳව අවබෝධ කරගනිමින් තම පක්ෂය රැක ගනිමින් වෙනත් පක්ෂ වලට ආරාධනා ලැබුණත් ඒවා පිළි නොගෙන කටයුතු කළ බව එතුමා වැඩි දුරටත් පැවසුවේය.

**v. ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා**

මංගල ඔළුගල මාර්ගය පිළිබඳව සාකච්ඡාවට භාජනය වුනා මෙම මාර්ගය 2020.12.21 වැඩ පටන් ගත්ත වැඩක් දන්න විදියට දහහතර ලක්ෂ විසිදහසක් තමයි ඒ සඳහා වෙන වී තිබෙන්නේ. මෙම ව්‍යාපෘතිය අවසන් අධියරට යද්දි අතරමැද නතරවෙලා කාණු පද්ධතිය සකස් කර නොමැති නිසා මාර්ගය වර්ෂාවට සෝදාගෙන ගොස් තිබෙනවා. ගමේ කට්ටිය මුදල් එකතු කරලා මාර්ගය නැවත පිළිසකර කර තිබෙනවා. මෙම මාර්ගය සකස් කළාට පසුව සභාවේ ලේකම්තුමියට , පළාත් පාලන කොමසාරිස්වරයාට ලිපි දීලා තියෙනවා මෙහි අසාධාරණයක් වෙලා තිබෙනවා අපක්ෂ පාති පරීක්ෂනයක් සිදුකර වාර්තාවක් ලබාදෙනකන් මුදල් නිදහස් කිරීමට කටයුතු කරන්න එපා කියලා. කවුරුත් මේවා අනුමත කලයුතු නැති බව එතුමා පැවසුවේය. මෙම ව්‍යාපෘතිය තුළ වංචාවක් තියෙන බව පැහැදිලිව තමන් දන්නා බව එතුමා පැවසුවේය.

පළාත් පාලන මැතිවරණයක් ප්‍රකාශයට පත් කරලා තියෙන අවධියක අපි මැතිවරණ කටයුතු සිදු කරමින් යනවා. නමුත් ජනතාවගේ අයිතියක් වන ඡන්දය කල් දැමීමක් සිදුකර ජනතා අයිතිය අහෝසි කිරීමට යනවානම් ජනතාව ඒ පිළිබඳව තිරණයක් ගනු ඇතැයි එතුමා පැසුවේය. ජනතාවේ දැවෙන ආර්ථික

අපහසුතා පිළිබඳව ජනතාව පාරට බැහැලා කිව්වා ඒ පිළිබඳව තැකීමක් නොමැතිව කටයුතු කරනවා නම් ජනතාවත් පැහැදිලි තීරණයක් ගනු ඇතැයිද එතුමා පැවසුවේය. අපි මැතිවරණයකට සූදානමින් ඉන්නවා අපි ගමට ගිහින් කතා කරනවා වෙනදාට වඩා ගම්වල ජනතාව මාලිමාව වටේ එක්රොක් වන බව එතුමා පැවසුවේය.

පක්ෂයක් විදියට ප්‍රතිපත්තියට අනුව පොදු අරමුදලකට අපේ දීමනාව ලබා දී තිබෙනවා මෙවරත් අපේක්ෂකයන් 22 දෙදෙනෙක් මැතිවරණය සඳහා ඉදිරිපත්වී තිබෙනවා.ඔවුන් සියළුම දෙනා පක්ෂයේ ප්‍රතිපත්ති වලට එකඟව කටයුතු කරන බවද එතුමා පැවසුවේය. මන්ත්‍රී කම තිබුනත් නැතත් අපි ජනතාවට වැඩ කිරීමට කටයුතු කරන බව එතුමා පැවසුවේය. කොරෝනා අවධියේ රතුතරුව මගින් විශාල වැඩ පිළිවෙළක් සිදුකළ බව එතුමා පැවසුවේය.

vi. ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා

මේ සභා වාරය අවසාන එකද නැද්ද කියන්න බැහැ.නමුත් බෝතුංග මන්ත්‍රීතුමා කිව්වා මේ එන අවසාන සභා වාරය වේවි කියලා ඔවුන්ගේ පක්ෂ ප්‍රතිපත්ති තුළින් ගන්නා තීන්දු තීරණ කෙසේ වෙතත් බෝතුංග මන්ත්‍රීතුමා සමඟ එකට මන්ත්‍රීවරයෙන් විදියට සැහෙන කාලයක් වැඩ කළා. ඒවගේම එතුමා කැපවීමෙන් ජනතාව වෙනුවෙන් සේවය කළ මන්ත්‍රීවරයෙක් බවත් , පක්ෂ මතවාද කොසේ වෙතත් පෞද්ගලික කුහකකම් වලින් තොරව වැඩ කළ මන්ත්‍රීවරයෙක් බව එතුමා සඳහන් කළේය.

ඔළුගල මාර්ගය පිළිබඳව කතා කළොත් මෙම මාර්ගය කොපමණ පිළිසකර කළත් වර්ෂා කාලයට ගලා එන ජලය පාර මතින් ගලා යෑම හේතුවෙන් සේදීයාමට ලක්වන බවත්, මෙම මාර්ගය පිළිසකර කිරීම සඳහා තමන් මන්ත්‍රීවරයෙක් ලෙස ප්‍රථම වරට පත්වූ අවස්ථාවේදී හියුම් පයිප්ප ලබාගෙන මෙම මාර්ගට ශ්‍රමදානයෙන් බෝක්කු දැමීම සිදුකළ බවත්, එසේ නොකලානම් අදවන විට මෙවැනි මාර්ගයක් දක්නට හෝ නොලැබෙන බව එතුමා සඳහන් කළේය.

සුරංගනී එල්ලාවල මැතිණිය විසින් රුපියල් ලක්ෂ හතරක ප්‍රතිපාදන ලබාදීමෙන් තාර දැමීම සිදුකළා ඒ වගේම තේ ශක්ති අරමුදලින් සල්ලි වගයක් ලැබුණා ගමේ කට්ටියත් එක්ක එදා සිටම ශ්‍රම දායකත්වයෙන් තමයි මෙම මාර්ගය පිළිසකර කිරීම් සිදුකළේ.

මෙම මාර්ගය සකස් කිරීම සඳහා පළාත් සභාවෙන් මුදල් ලැබුණු කාලයේ සිට අවසන් කරන ලද කාලය කොපමණද යන්න සොයා බැලිය යුතුයි. මෙම මාර්ගය නැවත ශ්‍රමදායකත්වයෙන් පිළිසකර කිරීම හොඳයි. නමුත් කී දවසක් එය සුරක්ෂිතව පවතීද යන්නත් සොයා බැලිය යුතු බව එතුමා පැවසුවේය. මොකද මෙම පාර ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසුව දීර්ඝ කාලීනව යථාතත්වයෙන් නොතිබූ බව එතුමා පැවසුවේය. මෙම මාර්ගය ගමේ කුමන හෝ සමිතියක් මගින් ගිවිසුම් අත්සන් කර පුව උප කොන්ත්‍රාත් ලබා දී හෝ ව්‍යාපෘතිය සිදුකළත් සමිතියට බැහැර වෙන්න බැරි බවද , මෙම මාර්ගයේ රැඳවුම් මුදල් ලබා ගැනීම සඳහා ආදාල සමිතියෙන් ලිපියක් නීතිත්‍යානුකූලව ලැබුණු නිසා රැඳවුම් නිදහස් කරන්නට ඇති බවද එතුමා පැවසුවේය. ගමේ සිටින සමිති නිලධාරීන් මෙම ගැටළු වලට මැදි වන බවද එතුමා වැඩි දුරටත් සඳහන් කළේය. වරදක් වෙලා තියෙනවානම් සොයා බැලිය යුතුයි.

මට මතයි 20%ක් ප්‍රජා දායකත්වය අරගෙන ව්‍යාපෘති කරන කාලවකවාණුවක සිමෙන්ති කොට්ට හතලිස් ගානක කොන්ක්‍රීට් එකක් දැම්මා වර්ෂාව ආව සියල්ලම සේදී ගියා.ඔය මාර්ගයේ ජලය සියල්ලම එන්නනේ මාර්ගය දිගේ කාණුවල වතුර එන්නේ නැහැ. ඉඩම් වලින් එන ජලය නතර කළොත් ඔය පාර ආරක්ෂා කළ හැකි නැතිව ඔය පාර ඔය විදිහට තව කී සැරයක් පිළිසකර කළත් සිදුවන්නේ ඔය දේම බව එතුමා පැවසුවේය. ඇත්ත දකින්නෙ නැතුව ප්‍රශ්ණ විතරක් දැකලා කටයුතු කරන හොඳමදි බව එතුමා සඳහන් කළේය. ඔළුගල මාර්ගයේ තත්වය ගමේ මිනිසුන්ගෙන් ඇහුවොත් කියයි යන්න එතුමා පැවසුවේය.

2022 පාර්ලිමේන්තුවට ගෙනා අයවැයේ නමුත් එය ක්‍රියාත්මක කරන්නට බැරි වුනා ජනතාවගේ පැත්තෙන් ගත්ත යෝජනා වලට තමයි මුදල් වෙන් කළේය. මුදල් නොමැති කම හෝ කුමන තත්වයක් යටතේ එය සිදු කිරීමට නොහැකි වුණත් මෙම අයවැය යෝජනා ගෙනාපු දවසේ සිටම ඔය 3% බොහොම කළබල වුන බවත්, මේක බිම පැළ කළොත් විශාල සංවර්ධනයක් කරන්න තිබුණා . ජීවනෝපාය සංවර්ධනයක් වීම අඩුම තරමේ එක් අයෙකුට තේ පැළ 500ක්වත් ලබා දීමට කටයුතු යොදමිනුයි තිබුණේ. මෙවැනි දේ කිරීමට සහය හල කරනවා වෙනුවට සෑම අවස්ථාවකදීම පක්ෂයක් හැටියට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් කටයුතු කරන බවත්, ප්‍රාදේශිය සභාවේ කිසිදු කාරක සභාවක හෝ නිලතලයක් ලබාගෙන කටයුතු කිරීමට ජනතා විමුක්ති පෙරමුණ කටයුතු නොකරන බවත්. සෑම දෙයම විරුද්ධවීම පමණක් සිදුකරන බවත් එතුමා පැවසුවේය. තමුන්නාන්සේලා බලයට පත් වුනත් ජනතාවගේ වැඩපිළිවෙළකට පක්ෂයක් හැටියට විරුද්ධයි කිව්වොත් ජනතාව අමාරුවේ වැටෙන බව එතුමා වැඩි දුරටත් සඳහන් කළේය.

විදෙස් රටවලින් එන සල්ලි වලින් විරෝධතා පෙළපාලි ගිහින් ජනතාව අවුල් කරන බව එතුමා සඳහන් කළේය. ජනතාව වෙනුවෙන්ම කැපවීමෙන් වැඩ කරන බව ප්‍රකාශ කරනවා අපි වැටුප ගන් නැහැ කියලා නමුත් පොදු අරමුදලකට ඒවා යවලා ආපහු ඒවා ඔබ තමුන්නාසේලා අතට පත් කරගන්නා බව එතුමා පැවසුවේය.

**vii. ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් මහතා**

ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය පවත්වපුවාම ඇත්ත තත්වය දැකගත හැකි බව එතුමා පැවසුවේය. ඡන්ද අපේක්ෂකත්වයට මාළිමාවට කවුරුත් නැතිව පොහොට්ටුවේ පිරිස් යොදාගෙන ඇති බවත්, ගුරුබැවිළාගම කොට්ඨාශය තමන් ජයග්‍රහනය කරන බවත් ලිස්ට් එකෙන් තමන් මන්ත්‍රීධුරයක් අරගෙන සභාවට එන්නේ නැති බව එතුමා පැවසුවේය.

**viii. ගරු මන්ත්‍රී තමරා සුභාෂිණී මහත්මිය**

කොට්ඨාශයතුළ පානීය ජලය සම්බන්ධව ගැටළුකාරී තත්වයක් ඇති වී තිබෙන බවත්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් ජල සාම්පල පරීක්ෂාවට යොමුකිරීමෙන් පසුව දැනුම් දී ඇත්තේ එම ජල සාම්පල තුළඊ-කෝලා හා ක්ලොරිෆෝම් කියන බැක්ටීරියා දෙක එම ජල සාම්පල වල අඩංගු බව.ඒවා අපේ කොට්ඨාශයේ සියළුම දෙනා පානය කරන්නේ එම ජලය . උඩකන්ද ජල උල්පතින් තමයි මේ ජලය ලබාගන්නේ ගල්ලෑල්ල රෝහලටත් ජලය ලබාගන්නේ මේ උල්තින්ම තමයි.ඒ මෙම පානීය ජලය ගැටළුව ඇති වී තිබෙන්නේ රිළව්, වඳුරො වැනි සතුන්ගේ මළපහ හේතුවෙන් බවයි කියන්නේ. මේ සම්බන්ධව පියවරක් ගන්න කියලා ඉල්ලා සිටිනවා. පිරිසිදු ජලය පානය කරන්න අවස්ථාව සලසා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට යොමු කර සෙව්ළි තහඩු ලබාදෙන්න කියන ඉල්ලීම ගියවර සභාවේදීත් කතා කළා. ඒ යෝජනාව ස්ථිර කළෙත් මම . මගේ යෝජනාව ලිඛිතව ලබා දුන්නා .නමුත් මේ කිසිදු වාර්තාවකවත් එය ඇතුලත් වෙලා නැහැ.ඊට හේතුව දන් නැහැ. මම ඉල්ලා සිටිනවා මගේ යෝජනාවත් ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට යොමු කිරීමට කටයුතු කරන ලෙසට.

**ix. ගරු මන්ත්‍රී උදය කුමාර් මහතා**

මේ සභාවට මා පත් කරපු මගේ නම යෝජනා කළ මගේ ජයග්‍රහනය වෙනුවෙන් කැපවුණු සියළුම දෙනාට ස්තූතිවන්ත වන බවත්, මට ඔවුන් වෙනුවෙන් යම්කිසි දෙයක් සිදුකරන්නට මේ සභාව තුළින් හැකියාවක් ලැබුණානම් එයටත් ස්තූතිවන්ත වන බවද, මේ වන විටත්, මට හඳවතින්ම උදව් කරන මගේ යහළුවන්ටද මේ අවස්ථාවේදී ස්තූතිවන්ත වන බව එතුමා සඳහන් කළේය. එදා මා සභාවට පත්වන අවස්ථාවේදී හිටපු ලේකම් තුමාටද, පසුව මාසයක් දෙකක් හිටපු ලේකම් තුමියටද ඒ වගේම සියළුම කාර්යය මණ්ඩලයට ස්තූතිවන්ත වන බවත්, මට මෙම සභාවෙන් උදව්වක් ඉල්ලු අවස්ථාවේ දී සහයෝගය ලබා දී තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබ තුමාගෙන්ද මගේ කොට්ඨාශයේ සංවර්ධනය වෙනුවෙන් ලබා දුන් සහයෝගයට හා වීථි ලාම්පු ලබාදුන්නා , ඒ වගේම රණවක මන්ත්‍රීතුමාටත් ස්තූතිවන්ත වෙනවා මගේ කොට්ඨාශයේ අවුරුදු උත්සවය අවස්ථාවේදී වීථි ලාම්පු සවි කිරීමට ඔහුගේ අවස්ථාව කැපකරමින් මා හට ලබා දීම සම්බන්ධව.

බෝතුංග මන්ත්‍රිතුමාටත් ස්තූති වන්ත වෙනවා. මගේ කොට්ඨාශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් යා යුතු මාර්ගය පෙන්වා දීමට කටයුතු කළා. ජේෂ්ඨ මන්ත්‍රීතුමාලාටත් ඔවුන්ගේ ආදර්ශයන් තුළින් තමන්ට අත්දැකීම් ලබා ගැනීමට හැකිවූ බවත්, එසේම ඊළඟ සභාවට පත්වෙයිද නැද්ද දන්නේ නැහැ නමුත් සියළුම දෙනා එක්ව රත්නපුර ප්‍රාදේශිය සභා බල ප්‍රෙද්ශය සංවර්ධනය කර ගැනීම සඳහා කටයුතු කළයුතු බව එතුමා සඳහන් කළේය.

**x. ගරු මන්ත්‍රී මෝහන සුන්දරම් මහතා (கௌரவ உறுப்பினர் மோஹன சுந்தரம் அவர்கள்)**

ගරු සභාපතිතුමනි, අනුර මන්ත්‍රීතුමා කතා කරන අවස්ථාවේදී බොහෝ දෙනෙක් විරෝධය එල කළා නමුත් මම කියන්න ඕනී කොරෝනා අවධියේදී මගේ කොට්ඨාශයේ පාසැළත් අනුර මන්ත්‍රීතුමාලාගේ සහයෝගයෙන් විෂබීජහරණය කරනු ලැබූ බව විදුහල්පතිතුමා පැවසූ බව එතුමා සඳහන් කළේය.

மதிப்பிற்குரிய அவை தலைவர் அவர்களே என்னை அரசியல் பாதைக்கு அழைத்து சென்ற நான் கொழும்பில் தொழில் புரிந்த நேரத்தில் ஹபுகஸ்தன்னையில் தமிழ் முற்போக்கு கூட்டணியின் சார்பில் போட்டியிட வைக்க முழுமையாக முயற்சித்த நாவலர் தமிழ் வித்தியாலய அதிபர் சசிகுமார் அவர்கள் அதேபோன்று கீரகல தமிழ் வித்தியாலய அதிபர் டேமியன் அவர்கள் அதேபோன்று தேல தமிழ் வித்தியாலய என்டன் ஆசிரியர் மற்றும் ஆசிரியர் சிவராஜ் அதேபோன்று இரத்தினபுரி தமிழ் வித்தியாலயத்தில் கடமையாட்டுகின்ற எமது இரத்தினபுரி மாவட்ட அமைப்பாளர் ஆசிரியர் சந்திரகுமார் அவர்களுக்கும் இவ்வேளையில் நன்றியை தெரிவித்துக்கொள்கின்றேன். இவர்களால் தான் நான் அரசியலில் பிரவேசித்து பல்வேறு வழிகளில் மக்களுக்கு சேவையாற்றி இருக்கின்றேன். ஹபுகஸ்தன்னை வரலாற்றிலே பல அபிவிருத்தி வேலைதிட்டங்களை இந்த பிரதேச சபையின் ஊடாக அல்லாமல் ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினர்களின் அனுமதியோடு பல அபிவிருத்தி திட்டங்களை. ஹபுகஸ்தன்னை மக்களுக்கு கொண்டு சென்றுள்ளேன். அதேபோன்று ஹபுகஸ்தன்னை வரலாற்றை எடுத்துக்கொண்டால் கௌரவ தலைவர் அவர்களே எத்தனையோ பிரதேச சபை உறுப்பினர்கள் இருந்திருக்கிறார்கள் மாகாண சபை உறுப்பினர்கள் கூட இருந்திருக்கிறார்கள் ஆனால் இது வரைக்கும் ஹபுகஸ்தன்னை வரலாற்றிலே அதிக அபிவிருத்தி வேலைதிட்டங்களை செய்த ஒருவன் என்ற ரீதியில் எனக்கு பெருமையாக உள்ளது.இதுவரை காலமும் அரசியலில் நாங்கள் வாக்களிப்பதை மாத்திரமே செய்துகொண்டிருந்தோம். இம்முறை பிரதேச சபையில் காலடி வைத்த பின்புதான் ஹபுகஸ்தன்னை பிரதேசத்திற்கு பல அபிவிருத்தி வேலைதிட்டங்களை செய்திருக்கின்றேன். குறிப்பாக சொல்ல வேண்டுமென்றால் 13000000 ரூபாவிற்கு அபிவிருத்தி பணிகளை செய்துள்ளேன். எனக்கு உறுதணையாக இருந்த தோட்ட தலைவர்மார் உட்பட அனைத்து நண்பர்கள், அரச உத்தியோகத்தர்கள் அனைவருக்கும் எனது மனமார்ந்த நன்றியை தெரிவித்துகொள்வதோடு மற்றும் ஒரு விடயத்தையும் கூற விரும்புகின்றேன். இந்த பிரதேச சபைக்கு வரும்போது ஹபுகஸ்தன்னை பிரதேசத்தில் ஒரு சமாதான நீதவான் ஒருவர் கூட இருக்கவில்லை. ஆனால் இன்று ஹபுகஸ்தன்னை பிரதேசத்தில் ஒவ்வொரு பகுதியிலும் சமாதான நீதவான்களை உருவாக்கிய பெருமை எனக்கே என்பதனையும்

இத்தோடு அறியத்தருகின்றேன். அத்தோடு இப்போது வருகின்ற தேர்தலை பார்க்கும் போது பல விதமான கட்சிகள் ஊடுறுவி வாக்குகளை சிதறடிக்க முற்படுகின்றார்கள்.இவ்வாறான சந்தர்ப்பத்தில் ஹபுகஸ்தன்னை வாழ் புத்திஜீவிகள் தகுதியான ஒருவருக்கு வாக்களிக்க வேண்டும். பல கட்சிகள் இருந்தாலும் சரியானவர்களுக்கு வாக்களித்து மக்களுக்கு சேவை செய்பவர்களை அடுத்த முறையும் சபைக்கு அனுப்ப வேண்டும் என்பதே எனது நோக்கம். ஐந்து வருடங்கள் இந்த சபையின் காலம் பூர்த்தியான நிலையில் எனக்கு உதவி புரிந்த அனைவருக்கும் நன்றியை தெரிவித்துக்கொள்வதொடு மீண்டும் இந்த சபைக்கு வருவேன் என்று கூறி விடைபெறுகிறேன். நன்றி வணக்கம்.

xi. ගරු සභාපති ඩබ්.ඩී.සුදත් දිසානායක මහතා

අද දින මහා සභාවට පැමිණි සියළුම දෙනාට හා ලේකම්තුමියට හා කාර්යය මණ්ඩලයට ස්තූතිය එළ කරමින් සියළුම දෙනාට ජය පතමින් සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක**
**සභාපති**
**රත්නපුර ප්‍රාදේශිය සභාව**